# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/1/4 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.08.30 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 03/2022

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>රාජ්‍ය වියදම් පාලනය කිරීම</u>**

උක්ත මැයෙන් යුතුව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන් සහ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් ආමන්ත්‍රිත ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/Circular/10/2022 දරන 2022.08.15 දිනැති ලිපිය සහ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2022.08.16 දිනැති, පළාත් රාජ්‍ය වියදම් කළමනාකරණය - 2022 යන ශීර්ෂයෙන් යුතුව සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් ආමන්ත්‍රිත ලිපිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය මෙයින් යොමු කරවමි. (එකී ලිපි පිටපත් මේ සමඟ අමුණා ඇත.)

02. ඒ අනුව, ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/Circular/10/2022 දරන චක්‍රලේඛයේ පළමු ඡේදය මඟින් දන්වා ඇති පරිදි ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි සඳහන් විධි විධාන අනුව කටයුතු කළ යුතු බවටත්, එම චක්‍රලේඛ විධි විධාන තරයේ අනුගමනය කළ යුතු බවටත්, එයට පරිබාහිරව සිදු කරනු ලබන රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලික වගකීමට බැඳෙන බවත් අවධාරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

03. එමෙන්ම, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2022.04.28 දින ලැබී ඇති බව මගේ අංක CSS/7/13/2/1-Vol 01 දරන 2022.05.09 දිනැති ලිපිය මඟින් දකුණු පළාතේ සියලුම ප්‍රධාන ගණන් දීමේ හා ගණන් දීමේ නිලධාරීන් වෙත මේ වන විටත් දන්වා ඇති බව ද අවධාරණය කරමි.

04. ඒ අනුව, මෙම දුෂ්කර අවස්ථාවේ රාජ්‍ය නිලධාරීන් වශයෙන් අප වෙත පැවරී ඇති වගකීම මනාව ඉටු කරමින් පවත්නා අභියෝගකාරී තත්ත්වය සමනය වන තෙක්, තිරසර රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම මඟින් ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීමටත්, එමඟින් මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමටත් අවශ්‍ය ඔබගේ දායකත්වය හා සහයෝගය ලබා දෙන මෙන් වැඩිදුරටත් ඉල්ලමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. සහකාර විගණකාධිපති, විගණන දෙපාර්තමේන්තුව, ගාල්ල. - දැ.ගැ.පි.
3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/SB/Circular(2022)/02 චක්‍රලේඛ අංකය: PS/SB/Circular/10/2022

2022 අගෝස්තු මස 15 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

**<u>රාජ්‍ය වියදම් පාලනය කිරීම</u>**

වර්තමානයෙහි රටෙහි පවත්නා ආර්ථික අර්බුදය හමුවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් විසින් රාජ්‍ය වියදම් පාලනය කිරීම කෙරෙහි දැඩිව සැළකිලිමත් විය යුතු බැවින්, භාණ්ඩාගාරයේ ලේකම් විසින් "රාජ්‍ය වියදම් පාලනය කිරීම"යන මැයෙන් යුතුව නිකුත් කරන ලද 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බවට ගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව, ඉහත චක්‍රලේඛ විධිවිධාන තරයේ අනුගමනය කිරීමට කටයුතු කරන ලෙසට මෙයින් දැනුම් දෙන අතර, එයට පරිබාහිරව සිදු කරනු ලබන රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් පෞද්ගලිකව වගකීමට බැඳී සිටින බව අවධාරණය කරමි.

ඊ.එම්.එස්.බී. ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත්:
1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. භාණ්ඩාගාරයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: PL/7/9/
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022/08/16

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

**<u>පළාත් සභා රාජ්‍ය වියදම් කළමනාකරණය - 2022</u>**

විනිමය අනුපාතය අවප්‍රමාණය වීම හා උද්ධමනය ඉහළයාම හේතුවෙන් දැනට අප රට මුහුණ පා ඇති අභියෝගකාරී ආර්ථික තත්ත්වය හමුවේ රාජ්‍ය වියදම් ඉහළයාම හා රාජ්‍ය ආදායම සීමිතවීම හේතුවෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය මහා පරිවයකින් හා දැඩි පාලනයකින් යුතුව මෙහෙයවීමට සිදුව තිබේ. එමෙන්ම මෙම දුෂ්කර අවස්ථාවේදී මහජනතාව වෙත සැපයිය යුතු සේවාවන් අඛණ්ඩව, කාර්යක්ෂමව, ඵලදායීව සැපයීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම කෙරෙහි රාජ්‍ය නිලධාරීන් වශයෙන් අප සැමගේ ප්‍රමුඛ අවධානය යොමු විය යුතුය.

2. එබැවින් පළාත් රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගනිමින් අනවශ්‍ය වියදම් කපා හැරීමටත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත සිදුකරන මධ්‍යම රජයෙන් හා සභා අරමුදල් මගින් වැටුප් ගෙවනු ලබන සියලුම බඳවා ගැනීම් කල්තැබීමටත්, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා හැර, ගරු ආණ්ඩුකාරවරුන්ගේ හා වෙනත් බලධාරීන්ගේ අනුමැතිය ලත් දීමනා නොගෙවීමටත් අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වන අතර, සිදු කළ යුතු අත්‍යවශ්‍ය ගෙවීම් පිළිබඳ නැවත සමාලෝචනයක් සිදු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි. එමෙන්ම මේ සම්බන්ධව නිකුත් කර ඇති භාණ්ඩාගාර ලේකම්ගේ 04/2022, 03/2021(1) හා 03/2022 යන අයවැය චක්‍රලේඛ කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරන අතර එම චක්‍රලේඛ විධිවිධාන තවදුරටත් නොවෙනස්ව බලපවත්වනු ඇත.

3. මෙම දුෂ්කර අවස්ථාවේදී පොදු මහජන සුබසිද්ධිය උදෙසා රාජ්‍ය නිලධාරීන් වශයෙන් අප වෙත පැවරී ඇති වගකීම මනාව ඉටු කරමින් පවත්නා අභියෝගකාරී තත්ත්වය සමනය වන තෙක්, තිරසාර රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම මගින් ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීමටත්, එමගින් මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමටත් ඔබ දක්වන දායකත්වය හා සහයෝගය අගය කොට සලකමි.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්

පිටපත් -
1. ආණ්ඩුකාර ලේකම් - ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා
2. සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් - කරු. අ.කා.ස.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk